# කොළඹ විශ්වවිද්‍යාලය

## ශාස්ත්‍ර පීඨය

## ශාස්ත්‍රවේදී උපාධි පළමු වසර පරීක්ෂණය

## දෙවන සෙමෙස්තරය- 2015/2016

## SLG 1202 – සාහිත්‍ය ප්‍රවේශය

(පැ දෙකයි)

ප්‍රශ්න <u>හතරකට</u> (04) **<u>පමණක්</u>** පිළිතුරු සපයන්න.

---

1. සාහිත්‍ය කලාවෙන් මිනිසාට තිබෙන ප්‍රයෝජනය කුමක්ද? යන පැනයට **"ජීවිතාවබෝධය"** පුළුල් කිරීම ය යන පිළිතුර සම්බන්ධව ඔබේ මතය නිදසුන් ඇසුරින් පැහැදිලි කරන්න.

2. සාහිත්‍ය විචාරයේ දී ප්‍රධාන වශයෙන් සිදු වන්නේ සාහිත්‍ය කෘතියක් අගය කිරීම, පැහැදිලි කිරීම සහ විග්‍රහ කිරීම යි. මේ කාර්යභාරය **"විරාගය"** නවකතාව ආශ්‍රයෙන් සිදු කරන්න.

3. නූතන සිංහල කවියෙහි ප්‍රගමනයට දායක වූ මතු දැක්වෙන කවීන් තිදෙනාගේ කාර්ය සාධනය විග්‍රහ කරන්න.

   i. ජී.බී. සේනානායක
   ii. ගුණදාස අමරසේකර
   iii. සිරි ගුණසිංහ

4. විවිධ සමාජ බලවේග හේතුවෙන් මිනිසා මුහුණ දෙන අනවරත අරගලය "නූතන සිංහල කෙටි කතා ඔස්සේ ද මනාව චිත්‍රණය වේ." නිදසුන් ඇසුරින් විමසන්න.

*අ.පි.බ*

5. **"මානව සම්බන්ධතා විෂයෙහි සියුම් අවබෝධයක් අත් කර ගැනීමටත්, මානව ජීවිතය** ගැඹුරින් පසක් කර ගැනීමටත්, විදේශීය සාහිත්‍ය පරිශීලනය වැදගත් වන්නේය." මේ අදහස ඔබ කැමති **විදේශීය කෙටි කතා** **<u>තුනක්</u>** ඇසුරින් පැහැදිලි කරන්න.

6. සොබා දහම සහ මිනිසා අතර පවත්නා අවියෝජනීය සම්බන්ධතාව මෙන්ම, මානව ප්‍රේමය පිළිබඳව ලියැවුණු රසවත් ගද්‍යමය ආඛ්‍යානයක් ලෙස **"අරණකට පෙම් බැඳ"** නම් වූ නවකතාව හැඳින්විය හැකිය. විමසන්න.

********************